


සෙව්වන්දිකා අබේරත්න ඔස්ට්‍රේලියාවේ විශේෂයෙන් මෙල්බර්න් පුරවරයේ රසික රසිකාවියන්ට නම් ආගන්තුක ගායිකාවක් නොවේ. ඇය වසර ගණනාවක් තිස්සේ ප්‍රසංග වේදිකාවලදීත් විවිධ සමාජීය හා ප්‍රජා කටයුතු වලදීත් නොමසුරුව දායක වෙමින් තම හැකියාවන් පෙන්වනු ලැබුවා. ඒ සෑම අවස්ථාවකදී ම රසික ප්‍රසාදයත් ආදරයත් ඇයට ලැබුණා.

මෙල්බර්න් හි ප්‍රසංග පැවැත්වීමට පැමිණි බොහෝ ශ්‍රී ලාංකික ප්‍රවීන ශිල්පීන්ට අත්වැල් ගායනයෙන් හා යුග ගායනයෙන් ඇය සහාය දැක්වූවා. ඒ අතරින් සුනිල් එදිරිසිංහ, අබේවර්ධන බාලසූරිය, ඉෂාක් බෙග්, වික්ටර් රත්නායක, අමරදේව, නන්දා මාලනී, නිරෝෂා විරාජිනී, ඇනස්ලි මාලේවන, එඩ්වඩ් ජයකොඩි, සනත් නන්දසිරි, මල්කාන්ති නන්දසිරි, සේනානායක වේරලියද්ද, ටී එම් ජයරත්න ආදී බොහෝ අය සිහිපත් කළ හැකියි.

මෙතෙක් කල් ඇය ගායනා කළේ අන් ගායිකාවන්ගේ ගීතයි. නමුත් මෙවර ජුනි 24 වෙනි දා කෙල්වොට්සන් රඟහලේ දී සවස 6.00 ට ඇය ඇගේම ගීත සමුච්චයක් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිනවා. ඉතින් සන්නස පුවත්පත වෙනුවෙන් ඒ පිළිබඳ ඔබ දැනුවත් කිරීමට අපි ඇයව හමුවුණා.

**සන්නස** - සෙව්වන්දිකා කොහොමද සංගීතයට හා ගායනයට යොමු වුණේ? අපිට ඔබ ආ ගමන ගැන පුංචි ආවර්ජණයක් කරන්න.

**සෙව්වන්දිකා** - බොහොම පුංචි අවධියේ ඉඳලම සින්දු කියපු හැටි මට තාමත් මතකයි. කවුරු හරි ගීතයක් ගායනය කරන්න කියපුවහම මම ඉස්සෙල්ලාම ගායනය කරන්නෙ 'ගමේ කෝපි කඩේ දෙන්න දෙපැත්තේ' කියන ගීතය. ඒක තමයි පොඩි කාලෙ මගේ ප්‍රියතම ගීතය වුණේ.

පාසල් අවධියේ දී තමයි මගේ සංගීත දිවියේ ජයග්‍රහණ බොහොමයක් ලැබුණේ. සමස්ථ ලංකා පාඨශාලීය තරග වලින් පිට පිට අවුරුදු තුනක් ඒකල ගායනයට මට ප්‍රථම ස්ථානය ලැබුණා. ඒ හින්දම රජයේ අනුග්‍රහය ඇතුව යුනිසෙෆ් ආයතනයෙන් මට බල්ගේරියා රටට යාමට ශිෂ්‍යත්වයක් ලැබුණා. එතකොට මගේ වයස අවුරුදු 10 යි. ඒක අමතක නොවන සිදුවීමක්. ඒ හැම දෙයක්ම පිටුපස සිටියේ මගේ සංගීත ගුරුපියා විනී ඩී බෝගොඩ මහතා. මම ඔහුව මේ අවස්ථාවේ ආදරයෙන් මතක් කරනවා.

ඊට පස්සෙ මගෙ තාත්තගෙ උනන්දු කිරීම නිසා ශාස්ත්‍රීය සංගීතය හදාරලා ඉන්දියාවේ භාත්ඛණ්ඩ විශ්ව විද්‍යාලයෙන් ගායනය පිළිබඳ ප්‍රථම පෙළ ඩිප්ලෝමාවත් වයලීන වාදනය පිළිබඳ ප්‍රථම පෙළ ඩිප්ලෝමාවත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව යටතේ පවත්වන ගාන්ධර්ව අවසාන විභාගයත් සමත් වුණා. ඒ එක්කම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ රුහුණු සේවයේ ළමා ගී ගායිකාවක් ලෙසත් වෙළඳ සේවයේ සරල ගී ගායිකාවක් ලෙසත් ගීත ගායනා කරල තියෙනව.

**සන්නස** - ඔබ ඔස්ට්‍රේලියාවට පැමිණි පසු කොහොමද මේ අලුත් සමාජ පරිසරය තුළ මේ තරම් රසික ප්‍රසාදයක් දිනාගත්තේ?

**සෙව්වන්දිකා** - අලුත් පරිසරයට හැඩ ගැහෙන්න ටික කලක් ගත වුණා. මගේත් සාවින්දගේත් හැකියාවන් ගැන පැහැදුන අශෝක අයිය (අශෝක සිල්වා) තමයි අපිට මුලින්ම ආරාධනය කළේ 3ZZZ ගුවන්විදුලියට වැඩසටහනක් කරන්න කියල. ඒ තමයි 'සෞන්දර්ය චාරිකා' කියන වැඩසටහන. එතැන් පටන් තමයි මෙල්බර්න් ශ්‍රී ලාංකික ප්‍රජාවත් සමග කලාව තුළින් අපි දායක වෙලා මේ තරම් දුරක් ආවේ.

විවිධ සංවිධාන විවිධ මිනිසුන් සමග කලා කටයුතු කිරීම තුළින් අත්දැකීම් රාශියක් ලැබුණා. මතභේදයක් නැතිව හැමෝටම මගේ හැකියාවෙන් උදව් කළා.

අපි ඉස්සෙල්ලාම කළ ප්‍රසංගය තමයි 'යශෝදරාවත' කියල පැරණි ගී එකතුවක්. සාවින්ද තමයි ඒක අධ්‍යක්ෂණය කළේ. එය නරඹන්න පැමිණි හැමෝම වගේ බොහෝම සතුටු වුණා. ප්‍රශංසා කළා. අපිව දිරිමත් කළා.

ඉන් පස්සේ මෙල්බර්න් නුවර විවිධ සංගීත කණ්ඩායම් සමග සම්බන්ධ වෙලා ගීත ගායනා කළා. දැන් මම Blossom සංගීත කණ්ඩායමේ නිත්‍ය ගායිකාවක් හැටියට කටයුතු කරනවා. විජිත අයියා (විජිත අමරසේකර) Blossom සංගීත කණ්ඩායෙමේ ප්‍රධානියා. ඔහු මේ ප්‍රසංගයටත් මගේ සංගීත දිවියටත් ලොකු රුකුලක් ලබා දෙනවා.

මම සහභාගි වුණ හැම ප්‍රසංගයකදීම මෙල්බර්න්වල ඉන්න රසික රසිකාවියන් මට පුද්ගලිකවම ඇවිල්ලා සුබ පතනවා. කථා කරනවා. ඒ අය බොහෝ වෙලාවට මගෙන් ඇහුවා 'ඇයි ඔයාගෙම සිංදු කියන්නෙ නැත්තේ?' කියලා. මං හිතන්නෙ ගායිකාවක් හැටියට ඒ අය මාව දිරිමත් කළා කියලා. මට ආදරය කළා කියලා. මගේ සීඩී තැටිය නිර්මාණය කිරීමටත් ඒ අයගේ දිරි දීම මට ලොකු පිටුවහලක් වුණා.

**සන්නස** - 'නෙතඟ නිලුපුල්' සීඩී තැටිය නිර්මාණය වුණේ කොහොමද?

**සෙව්වන්දිකා** - හුඟ කාලෙක ඉඳල මගේම ගීත ටිකක් කරන්න බලාපොරොත්තුවෙන් හිටියා. ඒත් හැම දේටම කාලය එන්න ඕන නේ. සාවින්ද ලියූ ගීත සෑහෙන ප්‍රමාණයක් තිබුණා. ඒ අතරට තවත් අයගේ ගීත කිහිපයක් එක් කරගන්න ඕනෙ කම තිබුණා. ඉතින් දැනට මාස කිහිපයකට උඩදි කළිඳු වීරසිංහ තමයි ඇවිල්ල කිව්වේ 'අක්කෙ මේ අවුරුද්දෙ වත් සීඩී එක කරමු' කියලා. ඉතින් සාවින්දගේ පද රචනා තුනකට කළිඳු අතින් තනු නිර්මාණය වුණා. මීට බොහෝ කලකට උඩදි ජගත් ජේ එදිරිසිංහ සාවින්දගේ ගීතයකට තනුවක් නිර්මාණය කර තිබුණා. ඉතින් මේ ගීත ටිකත් ඉතිරි ගීත ටිකත් සූදානම් කරල කළිඳු ලංකාවට යන්න සූදානමින් හිටි නිසා එයා අතේ ලංකාවට යැව්ව තනු නිර්මාණය කරල පටිගත කරන්න.

**සන්නස** - කව්ද මෙහි ගීත රචනා කරලා තියෙන්නෙ?

**සෙව්වන්දිකා** - මෙහි ගීත වැඩි හරියක් ම වරුණ සාවින්දගෙ. අවුරුදු ගාණක් තිස්සෙ එයා ලියූ ගීත අතරින් තමයි ඒ ගී තෝරා ගත්තෙ. තුසිත් අයියා (තුසිත් අබේනායක) තමයි ඒ ගීත තෝරා ගැනීමේ දී සාවින්ද සමග එකතු වුණේ. විවිධ අදහස් මතවාද ස්වයං විවේචන කරල කපලා කොටලා නැවත හදලා ගීත කිහිපයක් තෝරා ගත්ත. ඊට අමතරව සිසිර දිසානායක, ජගත් ජේ එදිරිසිංහ, රවී සිරිවර්ධන, තුසිත් අබේනායක, පද්මසිරි හේරත්, තරංග දන්දෙනිය ලියපු ගීත 6 ක් එකතු කර ගත්තා. මේ අය හැමෝම ඔස්ට්‍රේලියාවේ අපි අතර ඉන්න කලාකරුවන්. සිසිරත් රවීත් ලංකාවේ ගායක ගායිකාවන්ට ගීත රචනා කරන කරලා තියෙන හොඳ පද රචනා ශිල්පීන් දෙදෙනෙක්. ඒ වගේම ජගත් අයියත් තුසිත් අයියත් පද්මසිරි අයියත් තරංගත් හොඳ කවියන්. මෙහේ විවිධ මාධ්‍ය තුළින් ඔවුන්ගේ නිර්මාණ අපිට කියවන්න ලැබිලා තියෙනවා. ප්‍රවීන ගීත රචක බන්දුල නානායක්කාරවසම් පමණක් ලංකාවෙන් මේ සීඩී තැටියට ගීතයක් රචනා කරලා දායක වුණා.

**සන්නස** - එතකොට සංගීතය හා තනු නිර්මාණය?

**සෙව්වන්දිකා** - තනු නිර්මාණය සඳහාත් ලංකාවේ සංගීත නිර්මාණ ශිල්පීන් වගේම ඔස්ට්‍රේලියාවේ අපප අතර හිඳින සංගීත නිර්මාණ ශිල්පීන්ගේත් දායකත්වය ලබා ගත්තා.